www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බොල්ෂෙවිකයෝ බලය පිහිටුවති සෝවියට් පාලනයේ පලමු අවුරුද්ද පිලිබඳ මහාචාර්ය ඇලෙක්සැන්ඩර් රබිනොවිච්ගේ වැදගත් අධ්‍යයනය

**Bolsheviks in Power - Professor Alexander Rabinowitch's important study of the first year of soviet power**

**ෆ්‍රෙඩ්රික් කොස්ට් සහ ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2007 නොවැම්බර් 09**

ඇමරිකාවේ ඉන්දියානා විශ්ව විද්‍යාලයේ සම්මානනීය මහාචාර්ය ඇලෙක්සැන්ඩර් රබිනොවිච් විසින්, ඔක්තෝබර් විප්ලවයේ 90 වැනි සංවත්සරය වෙනුවෙන් ප්‍රකාශයට පත් කරන ලද, *Bolsheviks in Power* (බොල්ෂෙවිකයෝ බලය පිහිටුවති) යන ග්‍රන්ථය ඉතිහාසය පිලිබඳ අධ්‍යයනයේ වැදගත් එකතු කිරීමකි. එය, ධනේශ්වර තාවකාලික ආන්ඩුව පෙරලා දැමීමෙන් පසුව ඇති වූ දේශපාලන හා සමාජ ප්‍රතිවිරෝධයන් ද බොල්ෂෙවික් පාලනය ස්ථාපිත කිරීම පිලිබඳව ද, වසර ගනනාවක් ඉදිරියට දැනුම සම්පාදනය කරනු ඇත. පවත්නාවූ බුද්ධිමය වංචනිකභාවයට හා නරුමත්වයට තමන් විසින් ම අවනත වූ සෝවියට් අධ්‍යයන ක්ෂේත්‍රය තුල කටයුතු කරන වෙනත් බොහෝ දෙනෙකුට අත්‍යන්තයෙන්ම වෙනස් ලෙස, මහාචාර්ය රබිනොවිච් විද්වතෙකු ලෙස ඔහුගේ ඍජුභාවය සම්මුති ගසා නොමැත.

මෙම වෙලුම සකස් කිරීමේ දී රබිනොවිච් විසි වසරකට අධික කාලයක් පුරා දිවෙන ගවේෂනයන් රාශියක් පවත්වා ඇත. විප්ලවයේ පූර්ව රංගනය, පීට්‍රොග්‍රෑඩ් බොල්ෂෙවිකයන්, 1917 ජූලි නැගිටීම (1968) හා බොල්ෂෙවිකයෝ බලයට පැමිනෙති හා 1917 පීට්‍රොග්‍රෑඩයේ විප්ලවය (1976) යන ඔහුගේ මුල් කෘතීන් දෙක ප්‍රකාශයට පත් කොට වැඩි කලක් යාමට පෙර මෙම කෘතියේ පරිච්ඡේද කටුසටහන් කලේ කෙසේ දැයි පෙරවදනෙහි විස්තර කරයි. විශේෂයෙන්ම 1918 සම්බන්ධ ලේඛනාගාර තොරතුරුවල හිඟකම පිලිබඳව නොසතුටින් සිටි රබිනොවිච් මේ වන විටත් වසා තිබූ සෝවියට් රහස් ලේඛනාගාරවලට ඔහුට පිවිසීමට හැකිවේ යැයි කිසි සේත් බලාපොරොත්තු නොවීය. 1989 දී ඔහුගේ මහත් පුදුමයට මෙන්, බොල්ෂෙවිකයෝ බලයට පැමිනෙති. යන්නෙහි රුසියානු සංස්කරනය මොස්කව්හි දී ප්‍රකාශයට පත් කරන ලදී. ද්වාර විවර වීම ආරම්භවිය. 1991 දී පලමුව මොස්කව්හිදී ද ඊට පසුව ලෙනින්ග්‍රෑඩ්හිදී ද රජයේ හා කොමියුනිස්ට් පක්ෂ ලේඛනාගාරවල අධ්‍යයන කටයුතු කිරීමට ඔහුට අනුමැතිය ලැබුනි. 1993 දී කේජීබී (සෝවියට් රහස් ඔත්තු සේවය) ලේඛනාගාරවලට ප්‍රවේශය පවා ඔහු ලබා ගත්තේ ය.

ග්‍රන්ථය සිත්ගන්නා බුද්ධිමය ජයග්‍රහනයක් වන නමුදු, සැලකියයුතු සීමාවන්ගෙන් තොර ද නොවේ. එහි ඉදිරිපත් කරනු ලබන සත්‍ය තොරතුරුවල පලල් සංකීර්නත්වය වඩාත් ඒකාබද්ධ සමස්තයක් තුලට ගෙන ඒමට මහාචාර්ය රබිනොවිච්ට ඉඩ සලසනු පිනිස ඔහුට න්‍යායිකව මග පෙන්වන ලද සංකල්ප නොමැති වීම සැලකියයුතු අඩුපාඩුවකි. මෙය සත්‍ය විස්තර කථනයක් පූර්ව නිර්නිත දෘෂ්ටිමය ව්‍යාපෘතියකට යටත් කිරීම සඳහා ඉදිරිපත් කරන තර්කයක් නොවේ. ඊට වඩා දේශපාලන තීරන හා වැඩ කටයුතු නීර්නය වූ ඓතිහාසික සන්දර්භය නිරාවරනය කිරීම හා පැහැදිලි කිරීම පිලිබඳ කාර්යයකි. මෙම සන්දර්භමය මූලය අප්‍රමානවත් ලෙස වර්ධනය කර තිබෙනතාක් දුරට, එය විභාග කෙරෙමින් පවතින සිද්ධීන් පිලිබඳ ඒක පාර්ශ්වීය ඇගයීමක් කරා මෙහෙයවෙයි. ඔහුගේ අධ්‍යයන අධ්‍යාසයට සත්‍යවාදීව සිටිමින්ම මහාචාර්ය රබිනෝවිච් අතිශයින්ම අනුභූතික ප්‍රවේශයක අනතුරින් මුලුමනින්ම බේරී නොමැත.

එසේ වූවත්, විප්ලවයේ තොටිල්ල වූ පීට්‍රොග්‍රෑඩයේ බොල්ෂෙවික්වරුන් බලයේ සිටි පලමු වසර පිලිබඳ අධ්‍යයනයට ඔහුගේ ග්‍රන්ථය ඉතා වැදගත් එකතු කිරීමකි. මහාචාර්ය රබිනෝවිච් විසින් පලමුවරට පරිශීලනය කරන ලද තොරතුරු මූලාශ්‍රයන්ගේ ලේඛනය ඉතා දීර්ඝ යඃ 1918 සඳහා වූ පීටර්ස්බර්ග් බොල්ෂෙවික් කමිටුවේ හා සෙසු නගර පුරා පැවති රැස්වීම්වල සටහන්, බොල්ෂෙවික් දිස්ත්‍රික්ක පක්ෂ කමිටුවේ රැස්වීම් සටහන්; මහජන කොමසාරිස්වරුන්ගේ රැස්වීම්වල මුල් කෙටුම්පත්; පීට්‍රොග්‍රෑඩ් සෝවියට්වල හා නායකයින්ගේ කමිටුවල (ප්‍රධාන සැසිවාරයන්ගේ ලඝු ලේඛන වාර්තා; පීට්‍රොග්‍රෑඩ් දිස්ත්‍රික් සෝවියට් සභා

රුස්වීම් සටහන්; අභ්‍යන්තර ලියවිලි; හුවමාරු කර ගත් ලිපි ලේඛන; ප්‍රධාන බොල්ෂෙවික් නායකයින්ගේ පෞද්ගලික ලිපිගොනු; ප්‍රතිවිප්ලවයට, අනුමානවලට හා කඩාකප්පල් කිරීම්වලට එරෙහිව සටන් කිරීමේ සමස්ත රුසියානු අති විශේෂ කමිටුවේ සිද්ධි ලිපිගොනු (case file) ආදිය; මෙම ලේඛනාගාර මූලාශ්‍රවලට එකතු කල වෙනත් මුද්‍රිත තොරතුරුවල විශාල ලේඛනය; පුවත්පත් 51ක් (සමහර ඒවා අතිශයින්ම දුර්ලභය); ජර්නල හා වාර සඟරා 31ක්, ප්‍රකාශිත ලිපි ලේඛන, පොත්පත් ලේඛන පිටු 14ක්, දිනපොත් හා සමරු සටහන්, ද්වීතීය අධ්‍යයනයන්, ආශ්‍රිත පොත් හා බොහෝ වෙනත් පොත් එසේ නම්, මෙම නාස්තිකාර පර්යේෂනයේ ප්‍රතිඵල කවර්ද? ප්‍රධාන ප්‍රවාහයේ බොහෝ ඉතිහාසඥයින් මවිතයට පත් කරවමින්, ඔක්තෝබර් විප්ලවය ලෙනින් හා උන්මත්තකයින්ගේ කුඩා කන්ඩායමක් විසින් මෙහෙයවන ලද මිලිටරි කුමන්ත්‍රනයක් නොවන බව රබිනොවිච් ඔහුගේ මුල් කෘති දෙක මගින් ස්ථාපිත කලේ ය. ඊට වෙනස්ව ඔහු, "1917 දී පීට්‍රොග්‍රෑඩයේ බොල්ෂෙවික් පක්ෂය තෙමේම මහජන දේශපාලන පක්ෂයක් බවට පරිවර්තනය වීමත් එය විලංගු සහිත පියවර තබමින් ලෙනින් පිටු පස ගමන් කල ඒක ශෛලීය ව්‍යාපාරයක්. වනවා වෙනුවට එහි නායකත්වය වාමාංශිකයින්, මාධ්‍යමිකයින්, මධ්‍යස්ථ දක්ෂිනාංශිකයින් අතර බෙදී තිබුනු අතර ඒ හැම අයෙක් ම විප්ලවවාදී මූලෝපායන් හා උපායන් හැඩ ගැස්සීමට උදව් වූ බවත් සොයා ගත්තේය." (පි.ix).

"සංවිධානමය නම්‍යශීලීත්වය, විවෘතභාවය හා මහජන අභිප්‍රායන්ට සවන්දීම" මෙන්ම "ෆැක්ටරි කම්කරුවන්, සොල්දාදුවන්, පීට්‍රාග්‍රෑඩ් ආරක්ෂක බලකායන් හා බොල්ෂෙවික් නාවික බලකායේ නායකයින් සමග ඔවුන්ට පැවති ව්‍යාප්තවූ ද ප්‍රවේශමෙන් ගොඩ නගාගත්තා වූ ද සම්බන්ධතාවන්" ද රබිනොවිච් අවධාරනය කරයි. (පි.x) වහා සාමය, පාන් සහ ගොවීන්ට ඉඩම් යන බොල්ෂෙවික් පොරොන්දුව (චුම්බක ආකර්ෂනය) ද, බහු පාක්ෂික සෝවියට් සභා මගින් ක්‍රියාවට නංවන ලද පහල මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදය ද, රබිනොවිච් සැකයකින් තොරව පෙන්වා දෙයි.

එසේ වුවත්, මෙම මුලු විශ්ලේෂනයන්හි මොනතරම් යහ ගුනයක් පැවතියත් අදාල ප්‍රතිපත්ති සහිත ප්‍රජාතන්ත්‍රවාදී හා විසුරුනු පක්ෂයක්, සාපේක්ෂකව කෙටි කාලයක දී, ඉතිහාසඥයින්ගේ දෘෂ්ටියෙන් ගත් කල දැඩි හා මධ්‍යගත සංවිධානයක් වූයේ කෙසේ ද? යන්නට තවමත් උත්තර නොදී පසෙක තබා ඇතැයි රබිනොවිච් සිතයි. බොල්ෂෙවිකයන් පෙනී සිටි සෝවියට් ප්‍රජාතන්ත්‍රවාදය බිඳවැටීම කරා සාපේක්ෂකව ද වේගවත්ව ද මෙහෙයවුනු දේශපාලන ක්‍රියාදාමය වූයේ කුමක් ද?

ග්‍රන්ථයේ කොටස් හතර තුලින් මෙම ප්‍රශ්නවලට උත්තර දීමට උත්සාහ දැරේ. මෙකී කොටස් හතරින් සෑම කොටසක් ම පිටු 100ක් පමන දීර්ග වන අතර පරිච්ඡේද 3ක් හෝ 4ක් වන සේ ගොඩ නගා ඇත. අවධානය පීට්‍රොග්‍රෑඩ් වෙත ද, කාල රාමුව පලමු වසර ද යන්න සිත්හි තබා ගෙන පක්ෂ හා සංවිධාන ගැන ද කිසිවෙකුත් නොදන්නා හෝ මුලින් නොසලකා හරින ලද පුද්ගලයින් පිලිබඳ හෝ විටෙක හිස් බමවන කාරනා සමග විශ්ලේෂනයේ එල්ලය වේගයෙන් වෙනස්වේ. විස්තරවල පොහොසත්කම මේ වන විටත් අප විසින් සඳහන් කර ඇති කේන්ද්‍රීය අර්ථ නිරූපන ගැටලු ඉස්මතු කරයි: උදාහරනයක් හැටියට, රබිනොවිච් බහුතර පක්ෂය හා සෝවියට් සංවිධානය අතර පැද්දෙන ව්‍යුහාත්මක සම්බන්ධතාවන් වෙත යොමුවන විට හුදෙක් විස්තරවලින් පමනක් උද්දාමයට පත්වීම පහසුය. මෙවැනි මොහොතක, සාධක සහිත තොරතුරුවල පොහොසත්කම තිබියදී ම නැතිනම් ඒවායේ පොහොසත්කම නිසා ම හෝ, කර්තෘගේ ඉදිරිපත් කිරීම මෙහෙයවනු ලැබූ නිශ්චිත න්‍යායික රාමුව පැහැදිලි සේ දැකීම අපහසු යයි යමෙකු සිතනු ඇත. සාමාන්‍යයෙන් රබිනොවිච් ගෞරවනීය හා ස්ථාවර විෂය මූලිකත්වයක් පවත්වා ගෙන යාමට උත්සාහ දරන නමුත් විෂය මූලික කාරනය, එනම් පීට්‍රොග්‍රෑඩයේ බොල්ෂෙවික් පාලනයේ පලමු වසර මුලුමනින්ම අනුභූතික ප්‍රවේශයකින් විස්තර කල නොහැක. කාර් නමැති ඉතිහාසඥයා අඩ සියවසකට පෙර මතක් කර දුන් පරිදි විද්වතෙකු විසින් "නිර්දේශිත" කරුනු වැදගත්කමක් අත් කර ගනී. මේ නිර්දේශ කරන ක්‍රියාදාමය එක්තරා ආකාරයක සංකල්පමය රාමුවක පැටලේ. උදාහරනයක් ලෙස, අනවශ්‍ය දෙයින් අවශ්‍ය දෙය ද, අවිනිශ්චිත දෙයින් අනිවාර්ය දෙය ද වෙන් කර ගැනීමට ඔහුව මෙහෙයවනු ලබන්නේ කුමන ඉදිරිදර්ශනයකින් ද?

නොයෙකුත් තීරනාත්මක අවස්ථාවන්හි දී ඒවායේ දේශපාලන අර්ථය පිලිබඳව ඔහුගේ තක්සේරුව සමග එකඟ නොවුන ද රබිනොවිච් ඉදිරිපත් කරනු ලබන තොරතුරුවලින් මාක්ස්වාදය හදාරන්නෙකුට බොහෝ දේ ඉගෙන ගත හැක. මෙම ග්‍රන්ථය රචනා කරන වසරවල දී, සෝවියට් සංගමය පිලිබඳ ඓතිහාසික සාහිත්‍යයේ මේ වන විටත් විනාශකාරී ප්‍රවනතා දෙකක් ආධිපත්‍යය දැරූ බව අප සිත්හි තබා ගත යුතු යः එනම් 1. පැරනි සෝවියට් සංගමය තුල ද, වෙනත් තැන්වල ද තවමත් ආධිපත්‍යය දරන, දශක ගනනාවක් පැරනි ස්ටැලින්වාදී මුසාකරනයේ ගුරුකුලය. 2. සෝවියට් සංගමය වියරු සහගත මානව අත්හදා බැලීමක් ලෙස දකින "ප්‍රජාතන්ත්‍රවාදයට පක්ෂපාතී" ප්‍රතික්ෂේප කරන්නන්ගේ ගුරුකුලය. මෙම ප්‍රවනතාවයට අනුව ලෙනින් හා ට්‍රොට්ස්කි වැන්නවුන් බටහිර ප්‍රජාතන්ත්‍රවාදය දෙසට වූ රුසියාවේ "ස්වභාවික ඍජු

වෙනස" ට බාධා කල ප්‍රධාන හතුරෝ වෙති. රබිනොවිච් පැහැදිලිව ම මෙම ප්‍රවනතා දෙකම ප්‍රතික්ෂේප කරයි. එහෙත්, නිසැකව ම ඔහුගේ ලේඛනාගාර අධ්‍යයනයේ දී ඔවුන් අතර සාකච්ඡාවක් ගෙනයාමට ඔහුට සිදු වන්නට ඇත. නිල සෝවියට් ඉතිහාසයෙන් මකා දමන ලද ප්‍රධාන පාර්ශවකරුවන් ඇතුලු පුරාවෘතනයන් නැවත ස්ථාපනය කිරීමට පාදක වූ ලේඛනාගාර තොරතුරු සමුදායක් හාරා ඇවිස්සීමේ සරල කරුන ම අතිවිශාල ප්‍රතිපාදනයකි. කෙසේ නමුදු අපි ග්‍රන්ථයේ අන්තර්ගතය දෙසට හැරෙමු:

සෝවියට් සභාවල දෙවෙනි සමස්ත රුසියානු කොංග්‍රසය ආසන්නයේ දී බොල්ෂෙවිකයන් විසින් තාවකාලික ආන්ඩුව පෙරලා දැමීමත්, ඉන් පසුව නව සමාජවාදී ආන්ඩුවක් පිහිටුවීමට ගෙන ගිය අරගලයත් පලමුවැනි කොටසින් විස්තර කෙරේ. රබිනොවිච් " මධ්‍යස්තවාදීන්ගේ පරාජය" ගැන සඳහන් කරන විට ඔහු හුදෙක් බොල්ෂෙවික් පක්ෂයෙන් පිටත වූ වඩාත් මධ්‍යස්ත බලවේග ගැන සඳහන් කරනවා නොවේ. ඔහු බොල්ෂෙවික් පක්ෂය තුල ම ලෙනින්ගේ හා ට්‍රොට්ස්කිගේ ප්‍රතිපත්තිවලට වූ විරුද්ධත්වය පිලිබඳව ද දීර්ඝ ලෙස සාකච්ඡා කරයි. ලක්ෂයේ වාම විපාර්ශවයට නායකත්වය දෙමින් ලෙනින් හා ට්‍රොට්ස්කි අතර 1917-1918 පුරාවට ම පැවති කිට්ටු සහයෝගිතාවය රබිනෝවිච් දැඩිව අවධාරනය කරයි. "ඔවුනට රුසියාව තුල විප්ලවවාදී සෝවියට් බලය ස්ථාපිත කිරීම වැදගත්කම අතින් ලෝක පරිමාන සමාජවාදී විප්ලවයේ ක්ෂනික භාවය සඳහා සංඥාව නිකුත් කිරීමට වඩා අල්පතර ය." පක්ෂ මූලස්ථානය ගැන කෙටි කාලයක් වෙන් කරන ඔහු කමනෙව්, සිනොවියෙව්, මිලියුටින්, රයිකොව්, නොගින් හා ලුනාචාර්ස්කි ඇතුලු "මධ්‍යස්ථ" පක්ෂ නායකයින්ගේ කටයුතු ගැන පිටු ගනනාවක් කැප කරයි. 1917 ජූලි අගභාගයේ ඔවුන් සිරභාරයේ සිටිය දී, ලාරින්, ලොසොව්ස්කි, රියාෂනොව් ඇතුලු වැදගත් වාම මෙන්ෂෙවික් නායකයෝ ඔවුන් සමග එකතු වූහ. ඉතිහාසඥයාගේ අනුකම්පාව මධ්‍යස්ථවාදීන් වෙත බව යමෙකු සිතනු ඇත. මහාචාර්ය රබිනොවිච් ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව, තාවකාලික ආන්ඩුව පෙරලා දැමීම නිෂ්ප්‍රබා නොකර මෙන්ෂෙවික්වාදීන් සමග ඔවුන්ගේ දේශපාලන සම්මුතිය මල්පල ගැන්වීමට ගන්නා ලද උත්සාහය සාර්ථක වූයේ කෙසේදැයි සිතා ගැනීමට අපහසු ය. තාවකාලික ආන්ඩුව බිඳවැටී යම්තම් දින දෙකක් ගිය ඉක්බිත්තේ ඔවුන්ගේ "මදාවිය" සම්පූර්නයෙන් දිය කර හරින තෙක් බොල්ෂෙවිකයන් සමග මොනම ආකාරයකින් වත් සාකච්ඡා තහනම් යනුවෙන් මෙන්ෂවික් මධ්‍යම කාරක සභාව අනුමත කර ගත් දැඩිමතධාරී යෝජනාව ඉතිහාසඥයා ඉදිරිපත් කරයි. (පි.27) බොල්ෂෙවිකයන් හුදෙකලා කල හැකිය යන විශ්වාසයෙන් යුතුව මෙන්ෂෙවිකයන් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කිරීමට තීරනය කලහ. ට්‍රොට්ස්කි විසින් නායකත්වය දෙන ලද බොල්ෂෙවික් මිලිටරි විප්ලවකාරී කමිටුව වහාම යටත්වෙනු. එයට හුවමාරුවක් ලෙස, එහි නායකයන්ට එරෙහිව නඩු පැවරිය යුතු දැයි තීරනය කිරීමට ව්‍යවස්ථාදායක සභාව ට අවස්ථාවක් ලැබෙන තුරු පෞද්ගලික ආරක්ෂාව පිලිබඳ සහතිකයක් ඔවුනට ලැබෙනවා ඇත." (පි.28) මෙන්ෂෙවික් ඉල්ලීම ක්‍රියාවට නැගුවේ නම් එය ප්‍රතිවිරුද්ධවාදී ලේ වැගිරීමකට ඍජුව ම මග පැදෙනු ඇතැයි පලල් වශයෙන් පිලිගැනුනි. මාතෘ භූමිය හා විප්ලවය මුදාගැනීමේ සමස්ත රුසියානු කොමිටිය (ඒසීඑස්) නියෝජිතයන්ට අනතුරු ඇඟවූ මෙන්ෂෙවික් ජාත්‍යන්තරවාදීන්ගේ වඩා වාම පාර්ශවයේ සාමාජිකයෙකු වූ පී.පී. බිලම්ගේ ප්‍රකාශය රබිනොවිච් උපුටා දක්වයි: "බොල්ෂෙවිකයන්ගේ පරාජයේ අර්ථය කුමක් වනු ඇති දැයි ඔබලා සිතුවේ ද? බොල්ෂෙවිකයන්ගේ සටන කම්කරුවන්ගේ හා සොල්දාදුවන්ගේ සටනයි. නිර්ධනීන්ගේ පක්ෂය සමග කම්කරුවන් හා සොල්දාදුවන් කුඩු පට්ටම් කරනු ඇත". (පි. 29).

නව ආන්ඩුව පිහිටුවීම පිලිබඳ කලහකාරී විවාදයේ දී මෙන්ෂෙවික්වාදීන්, සමාජ විප්ලවවාදීන් (එස්ආර්) වික්ෂෙල් (දුම්රිය කම්කරු සංගමය) නියෝජිතයින් හා අනෙකුත් අය ලෙනින් හා ට්‍රොට්ස්කි ඉවත් කිරීමට කල ඉල්ලීමට ඇතැම් "මධ්‍යස්ථ බොල්ෂෙවික්වාදීහු" සැබැවින්ම සලකා බැලුවේය යන්න සිත් කාවදින්නකි. බොල්ෂෙවික් නායකත්වයන්තුල ම මධ්‍යස්ථවාදීන්ට එරෙහිව දැඩි සටනක් කිරීමට ලෙනින්ට බල කෙරිනි. 1917 නොවැම්බර් පලවෙනිදා මෙම අරගලයේ තීරනාත්මක අවස්ථාවේ දී ලෙනින්ට සොයාගතහැකිවූ එකම විශ්වාසදායී බොල්ෂෙවික්වාදී නායකයා ලියොන් ට්‍රොට්ස්කි බව රබිනොවිච් සඳහන් කරයි. ඔක්තෝබර් විප්ලවයට පසු දිනවල පක්ෂ නායකත්වය තුල පැවති වෙහෙසකර අරගලය පුරාවට ම, සම්මුතිවාදීන්ට එරෙහිව ලෙනින් "ට්‍රොට්ස්කි සමග උරෙන් උර පැහැර" සිටියේ ය. (පි.35)

ලෙනින් හා ට්‍රොට්ස්කි ඉවත් කර (ඝාතනය නොකරන්නේ නම් සිරගත කිරීමට ඉඩ තිබූ) බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුනේ නම් ප්‍රතිවිප්ලවය වැඩි ඈතක නොවිය හැකිව තිබුනි. මඳකුදු පසු නොබා දැඩිව ප්‍රතිචාරය දැක්වීමෙන් පමනක් ජයගත හැකි වූ බොහෝ වැට කඩොලු ඉදි කල බොල්ෂෙවික් විරුද්ධවාදීන්ගේ මුරන්ඩු භාවිතාව මෙම අරගලයේ විස්තරය කියවන අපගේ හිතට කාවදිනු ඇත. විය යුතු පරිදි ම අවසානයේ දී සමස්ත බොල්ෂෙවික් සව්නාර්කොම් පිහිටුවන ලදී. මධ්‍ය විධායක කමිටුව (සීඊඩී) සමග මෙම මන්ඩලයේ සම්බන්ධය දියාරු හා විවාදශීලීව පැවතුනි.

"කැරලිකරුවන්ගේ සිට පාලකයන්" දක්වන පරිවර්තනය වීමේ ක්‍රියා දාමය සරල එකක් වූයේ නැත.

ආහාර සැපයීම, ඉන්ධන, ප්‍රවාහනය, වැටුප්, නිවාස, වෛද්‍ය පහසුකම් හා තව බොහෝ දේ මීට පෙර එවැනි කටයුතු කිරීමේ අත්දැකීම්වලින් තොර කේඩර්වරුන් මගින් සංවිධානය කල යුතුව තිබුනි. පක්ෂ සාමාජිකත්වයෙන් වැඩි වන සංඛ්‍යාවක් සෝවියට් සභාවල හෝ හමුදාවෙහි වැඩවලට මාරු කරන ලදී. බොහෝ සංඛ්‍යාවක් රටෙහි අනෙක් ප්‍රදේශවල විප්ලවය ශක්තිමත් කිරීමේ කටයුතුවලට යෙදවුනි.

ව්‍යවස්ථාදායක සභාව සඳහා වූ ඡන්දය, එහි වැනෙන සුලු සැකැස්ම හා පසුව එහි හදිසි අභාවය ද පිලිබඳව රබිනොවිච් සැලකිය යුතු අවධානයක් දී ඇත. මෙම උත්සාහයේ දී බොල්ෂෙවිකයන් හා වාම සමාජ විප්ලවවාදීන් (ඔවුන්ගේ පදනම ප්‍රධාන කොට ම ගොවීන් මත විය) අතර සන්ධානය ප්‍රචන්ඩකාරී විය: චෙකාව (ප්‍රධාන ආරක්ෂක බලකාය) ව්‍යවස්ථාදායක සභාවට පක්ෂ කලහකාරී විය හැකි විශාල පෙලපාලිවලට වූ අනුකූලතාවය හා අවසාන වශයෙන් 1918 ජනවාරි 6 වැනි දා ව්‍යවස්ථාදායක සභාව විසින් ම එය විසුරුවා හැරීම පිලිබඳ නොඑකඟතාවන් මතුපිටට පැමිනියේ ය. නැවත වතාවක්, ලෙනින්ගේ ප්‍රතිපත්තිවලට දැඩි විරෝධයක් බොල්ෂෙවික් පක්ෂය තුලින් ම ඉස්මතු විය. රියාසනොව් එහි ප්‍රධාන භූමිකාව රඟපෑවේ ය.

කෙසේ නමුත්, බොහෝ සම්මත බොල්ෂෙවික් විරෝධී කතාන්තරවලට තියුනු ලෙස ප්‍රතිවිරුද්ධ ඇගැයීමක් ව්‍යවස්ථාදායක සභාව සඳහා වූ අරගල පිලිබඳව රබිනොවිච් ඉදිරිපත් කරයි: "ව්‍යවස්ථාදායක සභාව සඳහා වන මැතිවරන ප්‍රතිඵල විප්ලවවාදී බොල්ෂෙවික් ප්‍රතිපත්ති හා පීට්‍රොග්‍රෑඩ් කලාපයේ පහල පන්තිවල සෝවියට් පාලනයේ ප්‍රකාශනයක්" ය. බොල්ෂෙවික් විරෝධී "නොවයියා ෂිස්න්" ලියුම්කරුවෙකුගේ නිගමනයන් මෙසේ දක්වයි: " කෙසේ නමුත්, අපට එය දැනෙනු ඇත. අප අකැමති වූව ද එක් දෙයක් පිලිගත යුතු ය, ව්‍යවස්ථාදායක සභාව සම්බන්ධයෙන් ජීවා පීට්‍රොග්‍රෑඩයේ කම්කරුවෝ තමන්ගේ පන්ති අවශ්‍යතාවයන් වෙනුවෙන් නායකත්වය දෙන හා හඬ නගන අය බොල්ෂෙවික් වාදීන් යයි පිලිගනිති." (පි. 69) මැතිවරනයේ ප්‍රතිඵලත්, විප්ලවවාදී සමාජවාදී ආන්ඩුව වේගවත් අවසානයකට ගෙන ඒමට දුම්රිය කම්කරුවන් ගත් උත්සාහය බිඳ වැටීමත් අතර සම්බන්ධයක් ඇතැයි රබිනොවිච් හඟවයි.

ව්‍යවස්ථාදායක සභාව නිල වශයෙන් ආරම්භ කිරීම දක්වා වූ සිද්ධීන් පිලිබඳ පෘථුල විශ්ලේෂනයේ දී රබිනොවිච් දේශපාලන ප්‍රවනතාවයන් අතර අරගලයන්හි පිලිබිඹු වූ පන්ති බෙදීම් දක්ෂ ලෙස ප්‍රති නිර්මානය කරයි. පීට්‍රොග්‍රෑඩයේ කම්කරුවෝ බොල්ෂෙවික් ඉල්ලීම්වලට හිතපක්ෂපාතකම් පෙන්නුම් කලහ; ධනේශ්වර කැඩෙට් පක්ෂය පෙරමුන ගත් දක්ෂිනාංශික බලවේග ව්‍යවස්ථාදායක සභාව විප්ලවයට එරෙහි අවියක් ලෙස යොදා ගැනීමට සැලසුම් කරමින් සිටියහ. ව්‍යවස්ථාදායක සභාව තත්‍ය වශයෙන් විසුරුවා හැරීම කිසිදු වැදගත් ප්‍රතිරෝධයකට මුහුන නොපෑවේ ය. රබිනොවිච් පහත වාක්‍යයෙන් අවසන් කරයි.

"නිශ්චිතව මෙම ප්‍රතිඵලවලට දායක වූ කාරනා අතර ව්‍යවස්ථාදායක සභාව සඳහා වූ නොවැම්බර් මැද මැතිවරනයේ දී පිලිබිඹු වූ පරිදි පීට්‍රොග්‍රෑඩ් කලාපයේ බොල්ෂෙවික්වරුන්ට ලැබුනු ශක්තිමත් මහජන සහයෝගය හා මිලිටරි ආරක්ෂාව සැපයීමේ උත්සාහය සමාජ විප්ලවවාදී නායකයින් විසින් ප්‍රතික්ෂේප කිරීමත් සමග එක්ව සෝවියට් බලය ආරක්ෂා කිරීම සඳහා ආයුධ බලය යෙදීමට බොල්ෂෙවික්වරුන්ගේ හා වාම විරුද්ධවාදීන්ගේ වූ සූදානම මූලික විය. කෙසේ වෙතත්, වඩා වැදගත් වූයේ ලෙනින්ට අනදීමට ඉඩ දී සැහැල්ලුවෙන් ගෙදර ගිය රුසියානු ජනතාව ව්‍යවස්ථාදායක සභාවේ ඉරනම කෙරෙහි දැක්වූ උදාසීනත්වය දෙසට ස්වායට්ස්කි ඇඟිල්ල දික් කල විට ඔහු ඉලක්කයක් වීමේ සම්භාවිතාවක් පැවතීමයි." (පි. 127)

"ඈඳගැනීම් හෝ වන්දි ගෙවීම්වලින් හෝ තොරව මෙම ලෝක යුද්ධයේ රුසියානු සහභාගිත්වය අවසන් කිරීම සඳහා ජර්මනිය සමග බ්‍රෙස්ට්-ලිටොව්ස්ක්හි දී පැවති දුෂ්කර සාකච්ඡා වෙත ග්‍රන්ථයේ දෙවැනි කොටස යොමු වෙයි. "වන්දි හා ඈඳගැනීමෙන් තොරව" ජර්මනියට එරෙහිව විප්ලවවාදී යුද්ධයක් කල නොහැකි බවත් සම්පූර්න විපත්තියක් වැලැක්වීම සඳහා වේදනාකාරී "යාකරගැනීම්" සාමයක් සඳහා රුසියාවට බල කෙරෙනු ඇතැයි යන නිගමනයට දෙසැම්බර් මැද භාගයේ දී ලෙනින් පැමිනියේ කෙසේදැයි රබිනොවිච් මනාව විස්තර කරයි. මෙහිදී රබිනොවිච් - වොල්කොගොනොව් හා පයිප්ස් යන ඉතිහාසඥයන් දෙදෙනාට බියෙන් සැකයෙන් තොරව බලවත් විරෝධය පල කරයි: "සාමය පිලිබඳ කාරනාව ගැන ලෙනින්ගේ අදහස්වල වර්ධනය ගැන ඉතිහාසඥයෝ වාද කර ඇත.... ඔක්තෝබරය ද සමහර විට ඒ ආකාරයෙන් ම බ්‍රෙස්ට්- ලිටොව්ස්ක් හි පාවාදීම ද, රුසියාව අස්ථාවර කිරීමේ හා නැගෙනහිර පෙරමුනේ එදිරිවාදිකම් අවසන් කිරීමේ බොල්ෂෙවික් - ජර්මානු ඒකාබද්ධ ව්‍යාපාරයක අවස්ථාවක් විය හැකි බව සමහරු පවසති. මාගේ අධ්‍යයනයන් පහත සඳහන් නිගමනවලට මා මෙහෙයවී ය. විප්ලවවාදී රුසියාවේ පැවතීම සඳහා වහා සාමය අවශ්‍යය. යන විශ්වාසයෙන් ලෙනින් බලයට පැමිනිය ද, විදේශයන්හි ද සමාජවාදී විප්ලවයන්ගේ ශක්‍යතාවය පිලිබඳව ඔහුට පැවති ඒකාන්ත විශ්වාසය නිසා මේ පිලිබඳව ඔහු කරදර වූයේ නැත." අපේක්ෂා කල ජාත්‍යන්තර විප්ලවයන් ප්‍රමාද විය හැකිය යන නිගමනයට පැමිනි කල ලෙනින්, ජර්මානුවන් ඉදිරිපත් කරනු ලබන ඕනෑම සාම

කොන්දේසියක් පිලිගන්නවා හැර වෙනත් විකල්පයක් නැතැයි තීරනය කලේ ය. සෝවියට් රාජ්‍ය නායකයා වශයෙන් ලෙනින්ගේ කාලයේ දී ප්‍රගාඪ අභ්‍යන්තර පක්ෂ අර්බුදයට වේදිකාව සැකසුනි." (පි. 141)

බොල්ෂෙවික් පක්ෂයේ අභ්‍යන්තර අර්බුදය සැබැවින්ම තියුනු විය. විවිධ අවස්ථාවල දී රුසියාවේ විප්ලවය කැප කිරීමත් ඇතුලුව සියල්ල පරදුවට තබා අධිරාජ්‍යවාදය සමග විප්ලවවාදී යුද්ධය අඛන්ඩව ගෙන යායුතු යයි විශ්වාස කල බුකාරින්, රඩෙක්, වොල්ඩාරිස්කි හා රියාසනොව් නායකත්වය "වාම කොමියුනිස්ට්" කන්ඩායම මෙහෙයවූහ. ජර්මනියේ කොල්ලකාරී ප්‍රදේශ ඈඳා ගැනීමේ ඉල්ලීම්වලට යටත් වීම විප්ලවය සම්බන්ධයෙන් ගත් කල දැවැන්ත පාවාදීමක් වනු ඇති බව වාම සමාජ විප්ලවවාදීහු ද සිතූහ. බොල්ෂෙවික් පක්ෂය තුලත්, එය හා වෙනත් පක්ෂ අතරත් වූ විවාදය දැඩි හා කටුක එකක් විය. මේ අතර ට්‍රොට්ස්කි එරට තුල පවතින අසහනකාරි තත්වය තුල ජර්මනිය යලිත් මිලිටරි ප්‍රහාරයකට අවතීර්න වීමේ හැකියාව පිලිබඳව සැක පහල කලේය; හැකිතාක් දුරට කල් ගැනීම සඳහා බොල්ෂෙවිකයන්ට "යුද්ධයත් එපා සාමයත් එපා" යයි ප්‍රකාශ කිරීමට ද සාකච්ඡාවලින් ඉවත්ව යාමට ද පුලුවනැයි ඔහු අපේක්ෂා කලේ ය.

බොල්ෂෙවික් පක්ෂයේ මධ්‍යම කාරක සභාව ජනවාරි 11 වැනි දා මෙම උපක්‍රමයට එකඟ වූහ. පසුව වාම සමාජවිප්ලවවාදීහු එය තහවුරු කලෝ ය. බ්‍රෙස්ට්-ලිටොව්ස්කි සාකච්ඡාවල දී අධිරාජ්‍ය විරෝධී අභිප්‍රායන් වෙනුවෙන් ට්‍රොට්ස්කි නැගී සිටීමත් සමග ඇති වූ විප්ලවවාදී උද්දාමයට තම ගෞරවය පෙන්වීම යටපත් කර ගැනීමට, බොල්ෂෙවික්වාදීන් කෙරෙහි වූ සිය කටුක විරෝධය තිබියදී ම, මාටොව්ට පවා නොහැකි විය. සෝවියට් සභාවල තුන්වැනි සමස්ත රුසියානු කොංග්‍රසයේ දී ට්‍රොට්ස්කි කල කථාව ඇසීමෙන් පසු මාටොව්, "ලෝක ව්‍යාප්තව ජාත්‍යන්තර විප්ලවය රෝපනය කලවුන් ජගත් සාමය දිශාවට ගත් 'විස්මයාන්විත' පියවරක්" යයි ප්‍රකාශ කලේ ය. (පි. 146) ජනවාරි 28 වැනි දින, යුද්ධය අවසාන බවත්, රුසියාව ඒකපාර්ශවීයව හමුදා විසුරුවනු ලබන බවටත් ට්‍රොට්ස්කි කල ප්‍රකාශයෙන් ජර්මානුවෝ මවිතයට පත් වූහ. ජනවාරි 16 වැනි දින තාවකාලික සටන් විරාමය අවසන් බවත් සිය ප්‍රහාරය 18 වැනි දින යලි අරඹන බවත් ජර්මනිය නිවේදනය කලේ ය. පීට්‍රොග්‍රෑඩය අල්ලාගැනීමට තර්ජනය කල ආක්‍රමනය ඔවුහු වහාම ආරම්භ කලහ.

ඊට පසු පැමිනි දිනවල දී, වහාම ජර්මන් කොන්දේසි පිලිනොගතහොත් ලෙනින්ගේ ඉල්ලා අස්වීමේ තර්ජනය ද සහිත තියුනු විවාදයක් බොල්ෂෙවික් පක්ෂය තුල ඇරඹුනි. පෙබරවාරි 23 වැනි දා පැවති සුප්‍රසිද්ධ ඡන්ද විමසීමේ දී හත් දෙනෙක් (ලෙනින්, ස්ටැසෝවා, සිනොවියෙව්, ස්වෙඩ්ලෝව්, ස්ටැලින් සොකොල්නිකොව් හා ස්මිල්ගා) ජර්මන් කොන්දේසි පිලිගැනීමට පක්ෂ වූහ. හතරදෙනෙක් (බුබ්නෝව්, යුරිට්ස්කි, බුකාරින් හා ලොමෝව්) විරුද්ධ වූහ. හතරදෙනෙක් (ට්‍රොට්ස්කි, ක්‍රෙසිටින්කි, ඩ්‍රෙෂින්ස්කි හා ලෝපෙ) ඡන්දය දීමෙන් වැලකී සිටියහ. (පි. 174) සති කීපයකට පසු, මොස්කව්හිදී සෝවියට් සභාවල හතරවැනි සමස්ත රුසියානු කොංග්‍රසයේ දී බාරදූර බ්‍රෙස්ට්-ලිටොව්ස්ක් ගිවිසුම පිලිගත් විට වාම සමාජ විප්ලවවාදීහු ද වාම කොමායුනිස්ට් වාදීහු ද " සොවිනර්කෝමය" අතහැර ගියහ. මේ අතර ජර්මන් හමුදා ප්‍රහාරයකට ලක් වීමට ඇති ඉඩ සලකා, මධ්‍යම ආන්ඩුව පීට්‍රොග්‍රෑඩයෙන් මොස්කව්වලට ගෙන යන ලදී. මේ සියල්ලටම පසුව වුවත් විප්ලවයේ ගෙල මිරිකීමට ජර්මනිය යලි තීන්දු නොකරන්නේ යයි සහතිකයක් නොමැති විය.

මේ කාලයේ දී බොල්ෂෙවිකයන් මුහුන දුන් දුෂ්කරතාවයන් දැවැන්ත විය. ග්‍රන්ථයේ තුන්වැනි කොටස "සෝවියට් පාලනය අනතුරේ" යනුවෙන් නම් කර, ඒ පිලිබඳව විස්තර කරයි. මෙහිදී රබිනොවිච්, ජන සංඛ්‍යාව පහත වැටීම, විරැකියාව, සාගින්න, කොලරා වසංගතය, පක්ෂ සාමාජිකත්වය අඩු වීම, කර්මාන්තශාලා හා නාවික හමුදාවල අසහනය, සිවිල් යුද්ධය ගැඹුරු වීම, පෙට්‍රොග්‍රෑඩයේ දී වොලඩාරිස්කි (ජූනි 20) හා යුරිට්ස්කි (අගෝස්තු 30) ඝාතනය කිරීම හා මොස්කව්හිදී ලෙනින් (අගෝස්තු 30) ඝාතන තැත පිලිබඳව විස්තර කරයි.

උදාහරනයක් ලෙස, 1918 ජනවාරියේ සිට අප්‍රේල් දක්වා කාලයේ දී පීට්‍රොග්‍රෑඩ් කාර්මික ශ්‍රම බලකායෙන් දල වශයෙන් 134,000ක් කම්කරුවන් එනම් 46%ක් රැකියා විරහිත වූහ. ආහාර හිඟය උග්‍රවීමත් සමග ම මින් බොහෝ දෙනා පීට්‍රොග්‍රෑඩය අතහැර ගම්බදට පලා ගියහ. මේ නිසා 1917 ආරම්භයේ දී මිලියන 2.3ක් වූ නගරයේ ජනගහනය 1918 ජූනි වන විට මිලියන 1.5ක් දක්වා පහත වැටුනි. ඊට පසු ගිම්හානයේ දී කොලරා වසංගතය පැතිරෙත් ම තවත් දහස් ගනනක් නගරය අත හැර ගම්බදට ගියහ. මේ අතර බොල්ෂෙවික් පක්ෂය නිර්ධන පන්තිය සමග තීරනාත්මක සම්බන්ධය නැති වීමේ අනතුරට මුහුන පෑවේ යː පීට්‍රොග්‍රෑඩයේ පක්ෂ සාමාජිකත්වය ක්ෂය වන්නට විය. පෙබරවාරායේ දී 30,000 සිට ජූනි වන විට 13,472 දක්වා ද සැප්තැම්බරයේ දී 6,000 දක්වා ද පහත වැටුනි. කාන්තා කම්කරුවන් අතර ක්‍රියාකාරී සහයෝගය මුලුමනින්ම වාෂ්ප වී ගියේ ය. සැප්තැම්බරයේ දී පීට්‍රොග්‍රෑඩයේ කම්කරුවන් අතර කාන්තාවෝ වූයේ 700ක් පමනි. ඉන් ෆැක්ටරි කම්කරු කාන්තාවෝ වූයේ 50කි. එක් අවස්ථාවක දී 113,346ක් වූ ෆැක්ටරි කම්කරුවන් අතර 44,629ක් රැකියා නියුක්ත කම්කරු කාන්තාවෝ ය.

මෙම අර්බුදයට බොල්ෂෙවික් පක්ෂයේ හා වාම සමාජ විප්ලවවාදීන්ගේ ප්‍රතිචාරය රබිනොවිච්

පැහැදිලිව ඉදිරිපත් කරයි. ග්‍රන්ථයේ වැඩි කොටසක් පුරා ප්‍රශංසනීය ලෙස පැතිර පැවති වෛෂයික විලාශයෙන් ඔහු පෙනී සිටින්නේ මෙම කොටසේ දී ය. ගොවීන්ගේ ධාන්‍ය අතිරික්තය අත් පත් කර ගැනීම සඳහා නගරයෙන් සන්නද්ධ ආහාර සැපයුම් කන්ඩායමක් යැවීමේ ලෙනින්ගේ ප්‍රතිපත්තිය ගැන රබිනොවිච් තියුනු ලෙස විවේචනශීලී ය. ඔවුන්ගේ පරිභෝජනය හා බීජ සඳහා ධාන්‍යවලින් කොටසක් ලග තබා ගැනීමට ගොවීන්ට ඉඩ දීමටත්, ඊට වැඩි ඕනෑම ප්‍රමානයක් ජනසතු කිරීමටත්, අවශ්‍ය නම් ආයුධ බලය යෙදීමටත් ලෙනින් යෝජනා කලේ ය. ධනවත් ගොවීන් - විශේෂයෙන් කුලියට ගත් කම්කරුවන් වැඩට යොදාගත් ගෙවීන් (කුලාකයන්) විසින් සැඟවූ ආහාර තොග ඇති ස්ථාන සොයාගැනීමට උදව් කරනු පිනිස දුප්පත් ගොවීන්ගේ කමිටු (kombedy) පිහිටුවන ලදී. උදාහරනයක් ලෙස මැයි 20 වැනි දා "පීටර්ස්භි (පීට්‍රොග්‍රෑඩ්) කම්කරුවන් වෙත" යවන ලද ලියුමේ සඳහන් කරන ලද ඔහුගේ ප්‍රතිපත්ති පිලිබඳව ලෙනින් අවංක හා ඍජු විය. කෙසේ වුවත්, "ගම්බද පලාත්වල ශුද්ධ පෙලපාලිවලට කම්කරුවන් බිලීබාගන්නා ලෙනින්ගේ දෙවැනි ලිපිය පලමු ලිපියට වඩා කලබලකාරී ය. වඩාත් තැති ගන්නා සුලු හා නොසැලකිලිමත් එකකැයි රබිනොවිච් ලියයි. මෙම දෙවන ලිපියෙහි කැපීපෙනෙන වෙනස වූයේ එහි වාම සමාජ විප්ලවවාදීන්ට එල්ල කල බියකරු ප්‍රහාරයයි. එය දැන් කුලැක්වරුන් ආරක්ෂා කිරීමට නැඹුරුවූ, අත්‍යන්තයෙන්ම අවශ්‍යවූ බලයෙන් ධාන්‍ය අත්පත් කර ගැනීමේ ප්‍රතිපත්ති අවතක්සේරු කරන, සමස්තයක් වශයෙන් දේශීය හා ජාත්‍යන්තර ප්‍රතිවිප්ලවයට සමානව ම සෝවියට් බලය විනාස කරන දුර්වල කපටි එකකි" යි (පි. 271) ඉන් චෝදනා කෙරිනි.

එකතුකල කෘතිවල ඉංග්‍රීසි පරිවර්තනයේ 27 වැනි වෙලුමෙන් 391-398 දක්වා වන පිටුවල ලෙනින්ගේ ලිපිය සොයා ගත හැක. ලෙනින් කම්කරුවන් " බිලීබාගත්තා ද" නැතහොත් ඔහුගේ ලිපිය හිතුවක්කාර සාහසික එකක් ද යන්න තීරනය කිරීමට පාඨකයාට ඉඩ හරිමු. තව දුරටත්, සාගතය ඉතා උග්‍ර වූ පීට්‍රොග්‍රෑඩයේ දරුනු තත්වය අනුව ගොවීන් අතර ජනප්‍රිය නොවූ ප්‍රතිපත්ති අනුගමනය කිරීමට අකමැති වූ වාම සමාජ විප්ලවවාදීන් ලෙනින් විසින් ආත්ම විශ්වාසයක් නැති, දුර්වල කපටි හෝ කොන්ද පන නැතියවුන් ලෙස හැඳින්වීමට සුදුසු ද? රබිනොවිච් පිලිගන්නා ආකාරයට "අපගේ කම්කරුවන්ගේ අත්දැකීම් මඳ බව සහ ගැටලුවේ සංකීර්නත්වය ද කුලැක්වරුන්ට එල්ල කල ප්‍රහාරය මධ්‍යම ගොවීන්ට පහරක් වීම ද නිසා භයානක වැරදි කර ඇතැයි පලමුවෙන්ම පිලිගන්නා තැනැත්තා ලෙනින් වනු ඇත." මෙම "භයානක වැරදිවලට ලෙනින්ට වඩා වෙන කවුරු වග කිව යුතුදැ"යි අසමින් රබිනොවිච් විකාර ලෙස ලෙනින්ගේ පිලිගැනීම හඹා යයි. (පි. 286)

ඊනියා "ෂ්චැස්ට්නි පලහිලව්ව" සම්බන්ධයෙන් මහාචාර්ය රබිනොවිච් දක්වන සැලකිල්ල තුල ඊට විනිශ්චයෙහි වඩා වැදගත් දෝෂයක් දැකිය හැක. 1918 සරත් සමයේ හා ගිම්හානයේ මුල් කාලයේ දී බෝල්ටික් නාවුක බලඇනියේ අර්බුදය ගැන කතා කරන අතර ඇලෙක්සේයි ෂ්චැස්ට්නි නම් ප්‍රසිද්ධ රුසියානු නිලධාරියාගේ ඉරනම පිලිබඳව රබිනොවිච් විභාග කරයි. තමන්ට නියමිත අනෙකුත් රාජකාරී අතර ම ජර්මන් නාවුක හමුදාව විසින් අල්ලා ගැනීමේ තර්ජනයක් ඇතිවුවහොත් රුසියානු නාවුක බලඇනිය ගිලා බැස්සවීමේ වගකීම පැවරී තිබුනේ ඇලෙක්සි ෂ්චැස්ට්නිට ය. වෙඩි දමා පුපුරුවා හැරීමට සූදානම් කර තිබූ නාවික බල ඇනිය ලැඩෝනා විලට ගෙනයාම, එය පුපුරුවා හැරීමට සූදානම් කිරීම, ඉනෝහි (පීට්‍රොග්‍රෑඩයට ආසන්න) කුඩා වරායක් විනාස කිරීම හා එකී කටයුතුවලට අදාල නියෝග නිකුත් කිරීම සම්බන්ධයෙන් මැයි මාසයේ දී ෂ්චැස්ට්නි හා ට්‍රොට්ස්කි අතර ගැටුම් ඇති විය. මැයි 22 වැනි දා ෂ්චැස්ට්නි ඉල්ලා අස් විය. ඒ පිලිබඳව රබිනොවිච් ඉතා පැහැදිලිව හා ස්ථිරව ලියයිඃ ට්‍රොට්ස්කි (ඔහුගේ ඉල්ලා අස්වීම) ප්‍රතික්ෂේප කරයි, ඔහු මොස්කෝවට කැඳවයි, ඔහු අත් අඩංගුවට ගැනීමට කටයුතු යොදයි. තනි මතයට විමර්ශනයක් සංවිධානය කරයි, ව්‍යාජ නඩුවක්, සෝවියට් සමූහාන්ඩුවට එරෙහිව සටන් කිරීමේ දීර්ග කාලීන පරමාර්ථ ගැන පීට්‍රොග්‍රෑඩ් කොමියුනය පෙරලා දැමීම සඳහා උත්සාහ කිරීමේ ව්‍යාජ චෝදනා පත්‍රයක් මත මරන දන්ඩන තීන්දුව නිකුත් කරයි" (පි. 243) රබිනොවිච් අවසාන සටහනකින් චෝදනාව ශක්තිමත් කරයි. "උදාහරනයක් හැටියට, "පලමුවැනි හොරනඩුව" විය හැකි ෂ්චැස්ට්නි නඩු විභාගයේ දී සාක්ෂි දීමට අවසර ලැබුනු එකම සාක්ෂිකරුවා ට්‍රොට්ස්කි පමනි."

1995 පශ්චාත් මරන පරීක්ෂනයේ දී ෂ්චැස්ට්නිට එරෙහිව තිබූ සියලු චෝදනාවලින් ඔහු නිදොස් කොට නිල වශයෙන් පුනස්ථාපනය කරන ලදී. (පි. 435)

රබිනොවිච් මේ මාතෘකාව පිලිබඳ මීට පෙර ලිපි දෙකක් ලියා ඇත. එකක් ඉංග්‍රීසි බසින් 1999 දී ය, දෙවැන්න රුසියන් බසින් 2001 දී ය. ඔහුගේ වාසිය සඳහා වන සේ, පීටර්ස්බර්ග් සඳහා වන රුසියානු සමූහාන්ඩු ආරක්ෂක සේවයේ (ආර්එෆ්එස්එස්) ලේඛනාගාරයෙහි වූ ෂ්චැස්ට්නි පලහිලව්ව පිලිබඳ පිටු 262ක ලිපි ලේඛන ඔහු කියවා ඇත. මෙම රහස් ලේඛන ඔහුගේ 1999 ලිපියට පෙර විවෘත කොට තිබුනි - මෙම මූලාශ්‍රවලට ප්‍රවේශ නොවී රබිනොවිච්ගේ සියලු චෝදනාවලට උත්තර දීම අපහසු ය, නමුත් කරුනු දෙකක් පැහැදිලි කල යුතු ය. එකක් නම්, ෂ්චැස්ට්නිට එරෙහි ට්‍රොට්ස්කිගේ චෝදනා "විප්ලවය සන්නද්ධ කලේ කෙසේ ද" (How The Revolution Armed)

යන්නෙහි පලමු වෙලුමෙහි (නිව් පාර්ක් ප්‍රකාශන පිටු 173-82) මුද්‍රනය කර ඇති බව රබිනොවිච් පාඨකයාට නොදැන්වීම යි. දෙවැන්න, ඔහුගේ ඉහත කී ලිපියෙහි සඳහන් කර තිබුන ද, 1926 ට්‍රොට්ස්කිගේ ලේඛනවල (Trotski's works in 1926) පලමු කොටසේ 17 වැනි වෙලුමේ මෙම චෝදනාවන් නැවත මුද්‍රනය කල බව ද ඔහු සඳහන් නොකරයි. වෙනත් වචනවලින් කියනවා නම්, "ව්‍යාජ නඩුවේ" ඔහුගේ සාක්ෂි සඟවනවා වෙනුවට ට්‍රොට්ස්කි එය පුලුල් පාඨක පිරිසක් වෙත නොකඩා ඉදිරිපත් කලේ ය. රුසියානු නාවුක බලඇනිය විනාශ කලහැකි බව ද ඇතුලුව ගනුදෙනුවක් බොල්ෂෙවිකයන් විසින් ජර්මානුවන් සමග සූදානම් කරමින් සිටින බවට චෝදනා නගමින් ෂ්චැස්ට්නි බෝල්ටික් බලඇනිය තුල දූෂමාන ආරංචි පැතිරවීම ගැන ට්‍රොට්ස්කි බලවත් සේ සෝදිසියෙන් සිටියේ ය. කොන්ස්ටෑඩය හා නාවික වරායේ නවතා තිබූ නැව් සම්පූර්නයෙන්ම නිරායුධ කල යුතු බවට ජර්මන් නාවික හමුදාව බල කර සිටි බව කියන ලිපියක් (පසුව ව්‍යාජ එකක් බව පෙනී ගිය) පවා ෂ්චැස්ට්නි ගෙන ආවේ ය. (එම පි. 562) බොල්ටික් නාවුක බලඇනියේ අවිනිශ්චිත හා ව්‍යාකූල වාතාවරනය ද (මෙය රබිනොවිච් ඉතා හොඳින් විස්තර කරයි), බොල්ෂෙවිකයන් බ්‍රෙස්ට්-ලිටොව්ස්ක් හි දී විප්ලවය පාවාදුන් හා තවදුරටත් පාවාදීම් කර ගෙන යන බවට එල්ල කල චෝදනාවල දුබලකම ද, පීට්‍රොග්‍රෑඩයේ වෙඩික්කාරයන් සහ ඔබුහෝව් වැඩපලේ කම්කරුවන් අතර කැරලි ගැසීමට ආසන්න තත්වය ද, පීට්‍රොග්‍රෑඩයේ සිටි කොමී, බ්'රේලි හා ලෝකාෂ්ට් වැනි බ්‍රිතාන්‍ය ඔත්තුකරුවන්ගේ සැක සහිත ප්‍රයෝජනයක් ද සලකා (මෙහිදී රබිනොවිච් මැනවින් ඉදිරිපත් කරන) සලකා බලා ට්‍රොට්ස්කිට ගැරහීමේ දී කතුවරයා තරමක් හෝ වඩා විචක්ෂනශීලී විය යුතුව තිබුනේ නොවේ ද? අදාල තාලයේ වාතාවරනය සලකා පරීක්ෂනය, නඩු විභාගය හා මරනදන්ඩනය මුලුමනින් ම යුක්ති සහගත කල නොහැකි ද? නැතිනම් රබිනොවිච් ම උපුටා දක්වමු:

"ජූනි 22වැනි දා පීට්‍රොග්‍රෑඩයේ විශාලතම ෆැක්ටරිවලින් එකක් වූ ඔබුහෝව් කම්හලෙහි අන්දමන්දව සිටි කම්කරුවන් හා එක්ව නාවික හමුදා වෙඩික්කාරයන් ව්‍යවස්ථාදායක සබාව නැවත කැඳවීමේ බලාපොරොත්තුව සහිතව වහාම සමජාතීය සමාජවාදී සෝවියට් සමූහාන්ඩුවක් පිහිටුවන ලෙස ඉල්ලා ආයුධ සන්නද්ධ නැගිටීමට මුල පිරුවෝ ය. මෙය සාර්ථකව මැඩ පැවැත්වූවත්, කැරැල්ල මෙම අවස්ථාවේ පීට්‍රොග්‍රෑඩ් සෝවියට් පාලනයේ ගැඹුරු අර්බුදයේ පෙර නිමිත්තකි." (ඇලෙක්සැන්ඩර් රබිනොවිච්, ස්චැස්ට්නි ලිපි ගොනු; ට්‍රොට්ස්කි හා බෝල්ටික් නාවුක හමුදාවේ වීරයා; රුසියානු පුනරීක්ෂනය, 58 වෙලුම නොවැම්බර් 4 (ඔක්තෝබර් 1999), පිටු 633)

තව දුරටත් "බාගවෙලාවට පලමු සෝවියට් හොරනඩුවට" සහභාගි වීම පිලිබඳව ට්‍රොට්ස්කිට චෝදනා කිරීම රබිනොවිච් වැනි දක්ෂ ඉතිහාසඥයෙකුට තරම් නොවේ. සෑම අයෙකුගේ ම හිස අවදානමෙහි පැවති සිවිල් යුද්ධයේ පුපුරන සුලු පසුබිමෙහි බොල්ෂෙවික් පාලනය මුහුන දුන් තත්වයත්, 1936 ස්ටැලින් මුහුන දුන් තත්වයත් ලෝක දෙකකි. ට්‍රොට්ස්කි අනවශ්‍ය කෲරත්වයකින් වැඩ කලා යැයි රබිනොවිච් විශ්වාස කලා වියහැක. නමුත් විප්ලවවාදී අධිකරනය ඉදිරියේ ඔහු විසින් ඉදිරිපත් කරන ලද කරුනුවලට වඩා වෙනස් ආකාරයට ට්‍රොට්ස්කි ක්‍රියා කලාය යන්න යෝජනා කිරීමට අවශ්‍ය සාක්ෂි ඔහු ඉදිරිපත් නොකරයි. 1936ට පෙර ස්වභාවිකව හෝ සාහසික ක්‍රියා හේතු කොට ගෙන හෝ මිය නොගිය, ඔහුගේ පොතෙහි සඳහන් ඔහු හොඳටම දන්නා සියලු දෙනා ම පාහේ පසුව, 1937-38 අතරතුර භීෂන සමයේ දී ස්ටැලින් විසින් මෙහෙයවන ලද නියම 'හොර නඩු'වල දී වැනසුන බව රබිනොවිච් ස්ථිරව ම දනී. "බොල්ෂෙවිකයෝ බලය පිහිටුවති" කෘතිය යන්තමින් කියවාගෙන ගියහොත් ස්ටැලින්ගේ හොර නඩුවල දී මියගිය අයගේ පහත සඳහන් ලැයිස්තුව හමුවේ: රියසුනොව්, සිනොවියෙව්, කමනෙව්, රඩෙක්, ෂොරීන්, බුකාරින්, මිලියුටින්, ස්මිල්ගා, ක්‍රොස්ට්චිත්ති, ඔසීන්තී, ලොෂොව්ස්කි, ඩින්ජල් ස්ඩේට්, නොවීස්කි, බොකී, කොසිඩ්ර්, ස්පිරිදෝනෝවා හා වෙනත් අය ෂ්චැස්ට්නිට දඬුවම් කිරීම මගින් විප්ලවය ආරක්ෂා කිරීමෙන් ට්‍රොට්ස්කි නියම වශයෙන් ම ප්‍රතිවිප්ලවවාදී වූ මෙම සංහාරය ට පූර්වාදර්ශයක් සැපයුවා යයි ඇඟවීම සැලකියයුතු න්‍යායික අර්ථබාරයක් පෙන්වයි. තවමත් ට්‍රොට්ස්කිගේ ජීවිතය වෙලාගන්නා මුසාකරනයේ අභූත මට්ටම බලන විට, ලෙනින් හැරුන විට විප්ලවයේ ඉතාමත් වැදගත් පුද්ගලයා යක්ෂයෙකු බවට පත් කිරීම නීත්‍යානුකූල කිරීමට ෂ්චැස්ට්නි පලහිලව්ව විශේෂයෙන්ම රුසියාව තුල දී ඩැහැගන්නවාට යමෙක් තුල කිසිම සැකයක් හට නොගන්නවා ඇත. රබිනොවිච් මෙම ග්‍රන්ථයේ දෙවැනි සංස්කරනයකදී ෂ්චැස්ට්නි පලහිලව්ව පිලිබඳව නැවත සලකා බලා වඩා සමබර තක්සේරුවක් ඉදිරිපත් කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

රබිනොවිච් ග්‍රන්ථයේ තුන්වැනි කොටස "වාම සමාජ විප්ලවවාදීන්ගේ සිය දිවි නසා ගැනීම" යන කෙටි පරිච්ඡේදයකින් අවසන් කිරීම තරමක් උත්ප්‍රාස ජනක ය. එහි දී ඔහු ජර්මානු මිලිටරි ප්‍රහාරයක් අවුලවනු බලාපොරොත්තුවෙන් වාම සමාජ විප්ලවවාදීන්ගේ මධ්‍යම කාරක සභාව නිකුත්කල අනක් පිට ජර්මන් තානාපති මිර්ඩා සිටුවරයාව ජුලි 6වැනි දා ඝාතනය කිරීම විමසා බලයි. මෙම ඝාතනය "වාම සමාජ විප්ලවවාදීන්ගේ නැගිටීමක් ලෙස බොල්ෂෙවික් පක්ෂය දක්නා ලදී. අනෙකුත් වාම සමාජ විප්ලවවාදීන්ගේ - විශේෂයෙන්ම පීට්‍රොග්‍රෑඩයේ - නියත වශයෙන් ම

පැවති නුසුදානම නිසා රබිනෝවිච් මෙය ප්‍රශ්න කරයි. මෙහිදී රබිනොවිච් ලෙනින්ට හෝ ට්‍රොට්ස්කිට හෝ කිසිදා නුදුන් ලෙස ස්පිරිදොනෝවා හා අනෙකුත් වාම සමාජ විප්ලවාදීන්ට සමාව දීමේ දී ඉදිරියෙන් සිටී.

"බොල්ෂෙවිකයෝ බලය පිහිටුවති" හි අවසාන කොටස, 1918 අගෝස්තු 30 වැනි දා උරිට්ස්කි ඝාතනය කිරීම හා එදින ම පසුව ලෙනින් ට වෙඩි තැබීමෙන් ඉක්බිති දියත්වූ "රතු භීෂනය" පිලිබඳව විස්තර කරයි. භීෂනයේ ප්‍රධාන හේතුකාරකයන් වොලඩාර්ස්කි හා යුරිස්ට්කි ඝාතනය, හා ලෙනින් නූලෙන් බේරීම මුල් කොට ගෙන ලෙනින්ගෙන් එල්ල වූ පීඩනයට වඩා සිවිල් යුද්ධයේ දැඩි පසුබෑම ලෙස සලකමින් රබිනොවිච් පිටු 43කින් යුත් මේ කොටස තුල අවධානය යොමු කරයි. ඔහු සන්සුන් ලෙස භීෂනයේ පරිමාව තක්සේරු කරයි. එහි භයානක ස්වභාවය පීට්‍රොග්‍රෑඩ් චේකා රහස් පොලීසියේ ප්‍රධානියා වශයෙන් යුරිට්ස්කි බලයේ සිටි කාලයේ දී හඳුනාගත් හතුරන් සමග පැවති වෛරය පිරිමැසීමට පීට්‍රොග්‍රෑඩ් කම්කරුවන් කොටසකට පැවති නොඉවසිල්ල මත ආරෝපනය කරයි. (පි. 355)

ඔක්තෝබර් විප්ලවයේ පලමු සංවත්සරයට සූදානම් වීම හා එය සැමරීම කෙරෙහි අවධානය යොමු කරමින් සෙසු පිටු කීපය තරමක බලාපොරොත්තු රහිත නැම්යාවක් ගනී. 1918 අවසානය ලඟාවෙද්දී පීට්‍රොග්‍රෑඩයේ කම්කරුවන්ට සැමරීමට ඇත්තේ කුමක් දැයි විමසීමෙන් පසු ලෝක තත්වයේ බරපතල වෙනස්කම් - විශේෂයෙන්ම යුරෝපයේ - සටහන් කිරීමට රබිනොවිච් ඉදිරියට යයි. ජර්මන් හමුදා මුලුමනින්ම පසුබසිමින් සිටියහ. ඔක්තෝබරයේ දී හා නොවැම්බරයේ දී "ජර්මානු යුද උත්සාහයන් සම්පූර්නයෙන් ම බිඳ වැටුනි. හැබ්ස්බර්ග් අධිරාජ්‍යය සුනුවිසුනු වීය. ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයන් මධ්‍යම යුරෝපයේ පැරනි පර්යාය පෙරලා දැමීය. රුසියාව තුල සෝවියට් බලය සම්පූර්න වසරක් පුරා පැවතියේ ය. යන කරුනින් (අර්ථභාරීව පැරිස් කොමියුනයේ ආදර්ශයට වඩා දිගු කලක්) හා ගෝලීය සමාජවාදී සහශ්‍රකයේ ආරම්භක පෙරමුනු බලඇනිය තමන් ය යන තිරසාර විශ්වාසයෙන් පීට්‍රොග්‍රෑඩ් බොල්ෂෙවික් නායකයෝ ශක්තිය උකහා ගත්හ. (පි. 356-57) නාට්‍ය, විවිධප්‍රසංග, චිත්‍රපට, පෙලපාලි, ගිනිකෙලි, රැලි (රැස්වීම්) කවි ගායනා සහ ආහාර පාන ඕනෑ තරම් ආහාර පානවලින් යුත් දැවැන්ත සැමරුම් සැලසුම් කෙරිනි. තම වැඩිහිටියන් සමග අන්ත දුෂ්කරතාවයන්ගෙන් පෙලුනු පීට්‍රොග්‍රෑඩයේ ලමුන් සඳහා තුන්වැනි දිනය පුද කල යුතු විය.

තථ්‍ය වශයෙන්ම, අභිමානයේ සුවිශේෂී හැඟීමත් එහි විය. "මොස්කව්වල තරගකාරී අයිතිවාසිකම් පැමට ඉහලින්, ලෝක පරිමාන සමාජවාදී විප්ලවයේ නායකත්වය සඳහා රතු පීට්‍රොග්‍රෑඩයේ වන අභිලාෂයන් තහවුරු කර ගැනීමට අවස්ථාවක් ලෙස පීට්‍රොග්‍රෑඩ් අධිකාරීහු ඔක්තෝබර් විප්ලවයේ පපලමුවැනි සංවත්සර ප්‍රීති උත්සවය දැකගත්හ. (පි. 371) බොහෝ විස්තරවලට අනුව නොවැම්බර් 7 සිට 9 වැනි දින දක්වා පැවති උත්සව දැවැන්ත ය, විශිෂ්ටය. සැබැවින්ම ප්‍රීතිමත් ය. ඊට පසු නොවැම්බර් 9/10 සවස ජර්මනියේ කයිසර් විල්හෙල්ම් රජකම අත්හල බවත් රුසියානු මොඩලයේ (ආදර්ශයේ) සෝවියට් ආන්ඩුවක් බර්ලිනයේ බලය ගෙන ඇත. යන ආරංචිය පීට්‍රොග්‍රෑඩය වෙත ලඟාවිය. එම අවස්ථාවේ පීට්‍රොග්‍රෑඩ් නෘත්‍ය ශාලාවේ සිටි ල්ලින් ෂෙනෙව්ස්කි, මෙසේ එය සිහිපත් කලේ ය.

"නිවේදනය මහා ඝෝෂාවකින් පිලිගැනිනි. උන්මාදනීය අත්පොලසන් නාදය මිනිත්තු ගනනාවක් ශාලාව දෙදරුම් කැවී ය. .. මෙන්න එය, එය පැමින ඇත, බටහිර යුරෝපයේ නිර්ධනීන්ගේ සහයෝගය, .. මෙතැන් සිට සියලු දේ වෙනත් විධියකට සිදු වනු ඇත. අපගේ සිතිවිලි බොහෝ ඈත ය. වීදිවල රතු ධජ පතාක ලෙල දෙන්නා වූ ද, කම්කරු නියෝජිතයින්ගේ සෝවියට් රැස්වීම් පැවැත්වෙන්නාවූ ලෝක සමාජවාදී විප්ලවයේ තවත් ගැටයක් තද කලා වූ ද බර්ලිනය පුරා සිසාරමින් තිබේ. (පි. 400)

"1918 ජර්මන් විප්ලවයේ මධ්‍යස්ථ ප්‍රතිඵල" හැඩ ගැසීමෙහි ලා වැදගත් කරුනක් වූයේ බොල්ෂෙවික් අන්තවාදය බැහැර කිරීමේ නැඹුරුව බව පසු කල්පනාවක් ලෙස රබිනොවිච් නිගමනය කරයි. මෙම වැරදි අර්ථකථනයට ඇදවැටීම සමාජවාදී විප්ලවය ලෙයෙහි ගිල්වා මැරීම වී යයි ඔහු ශෝකයෙන් සටහන් කරයි. "ඔක්තෝබර් විප්ලවයේ පලමුවැනි සංවත්සරය ප්‍රමුදිතව සැමරීමෙන් අනතුරුව, ඔවුන්ගේ විප්ලවවාදී ජර්මන් සහෝදරත්වය සමග ඒකාබද්ධවීම ලඟා නොවීම තුල, පීට්‍රොග්‍රෑඩයේ බොල්ෂෙවිකයෝ තනිව ම පැවතියහ. පැවැත්ම සඳහා වන ඔවුන්ගේ හුදෙකලා හා කැප වූ අරගලය හිනාවකින් තොරව නැවත පටන් ගත්තේ ය." (පි. 401)

ඔහුගේ අධ්‍යයනයේ දී රබිනොවිච්, සිතා බැලීම සඳහා අලුත් තොරතුරු රාශියක් සපයයි. රියාෂනොව්, යුරිට්සිකි, වොලොඩාර්ස්කි, ලූනාචාර්ස්කි, සමොයිලෝවා හා තවත් නොයෙකුත් අය ඉටු කරන ලද කාර්ය භාරය පිලිබඳව වටිනා චිත්‍රයක් ඔහු ගෙන හැර පායි. ලෝක සමාජවාදී විප්ලවය දෙසට වූ බොල්ෂෙවික් නැඹුරුව නිරන්තරයෙන් අවධාරනය කරයි, විප්ලවය යුරෝපය දෙසට ව්‍යාප්ත වන තුරු පැවැත්ම සඳහා වූ ඉමහත් බාධාවන් විචිත්‍ර ලෙස විස්තර කරයි. ඔහු මධ්‍යස්ථ ප්‍රජාතන්ත්‍රවාදීන්ට ප්‍රශංසා කරන අතර ම ඔවුන් ජයගත්තානම් සමාජවාදී විප්ලවය කුඩු පට්ටම් වී යන බව රබිනොවිච් දැන සිටි බව යමෙකුට හැඟෙනු ඇත. පීට්‍රොග්‍රෑඩයේ බොල්ෂෙවිකයන්ට පැරිස් කොමියුනය මැඩපැවැත්වීමේ මතකයන් තවමත් අගේ ය. එසේම බිහිසුනුය. 1918 දී යාබද පින්ලන්තයේ

සිදුවෙමින් පැවති බිහිසුනු "ධවල භීෂනය" වික්ටර් සර්ජ්ගේ "*විප්ලවයේ පලමු අවුරුද්ද*" හි මුලුමනින් ම විස්තර කර ඇති බව රබිනොවිච් ගෙනහැර දක්වයි.

බොල්ෂෙවික්වාදීන් වඩා මධ්‍යස්ථ ක්‍රියා පිළිවෙතක් අනුගමනය කලේ නම් ඔවුන්ට වඩා හොඳට සලකන්නට ඉඩ තිබුනේ ද?

බොල්ෂෙවික් පක්ෂය තුලත්, ඉන් පිටතත් වූ තම ප්‍රතිවාදීන්ට වඩා ලෙනින්ට හා ට්‍රොට්ස්කිට මහා දේශපාලන විචක්ෂනභාවයක් තිබුන බව ග්‍රන්ථය පුරාම රබිනොවිච් ගෙනහැර පායි. කෙසේ නමුදු, ඒවා මුලුමනින්ම සත්‍ය හෝ සැකයට බඳුන් වුවත් ඔහු ඔවුන්ගේ දෝෂය පෙන්වීමට ද උත්සාහ ගනී. ට්‍රොට්ස්කිගේ හැසිරීම තුල ඔහු දකින රලු බව, තුල (විශේෂයෙන්ම ෂ්චැස්ට්නි සිදුවීම පිලිබඳව රුසියානු සමාජයේ පමනක් නොව පලමු ලෝක යුද්ධ කාලයේදී බටහිර යුරෝපය ම අත්විඳි කෲරත්වය නොතකා හරින්නේ ය. ධනේශ්වර වනචාරිත්වයේ ලක්ෂනයක් ලෙස මරන දන්ඩනයට එරෙහිව රියාෂනොව්ගේ අධිෂ්ඨාන සහගත අරගලය කෙරෙහි ලැදියාවක් දක්වන යමෙක් වේ නම් ඔහු පීට්‍රොග්‍රෑඩයේ මර්දනය මධ්‍යස්ථ කිරීමට උත්සාහ කිරීම සම්බන්ධයෙන් යුරිට්ස්කි හා වොලඩාරිස්කිට ප්‍රශංසා කිරීමත් යන කරුනු මගින් රබිනොවිච් ප්‍රදර්ශනය කරන්නේ බොල්ෂෙවික් විරෝධීන්ට ක්වීන්ස්බරියේ ප්‍රභුවරයාගේ නීතිය[1] බල නොපාන බවයි. අවාසනාවන්ත ලෙස වොලොඩාර්ස්කි හා උරිට්ස්කි ඔවුන්ගේ මානව භක්තිය වෙනුවෙන් පිදුම් ලද්දේ මරාදැමීමෙනි. අප විසින් සටහන් කරන ලද සීමාවන් නොතකා "බොල්ෂෙවිකයෝ බලය පිහිටුවති" නමැති ග්‍රන්ථය විශාල පාඨකයන් සමූහයක් සොයාගනු ලබනු ඇතැයි බලාපොරොත්තු වන අතර එය ඔක්තෝබර් විප්ලවය හා එහි ප්‍රතිවිපාකයන් පිලිබඳව ගැඹුරු විශ්ලේෂනයකට එකතු කිරීමක් වනු ඇත.

1. <u>ක්වීන්ස්බරියේ ප්‍රභුවරයාගේ නීතිය</u>ඃ බොක්සින් ක්‍රීඩාවට සම්බන්ධ නීති පද්ධතියකි. එය ක්වීන්ස්බරියේ ප්‍රභුවරයා වූ ජෝන් ෂොල්ටෝ ඩග්ලස්ගේ අනුග්‍රහයෙන් ජෝන් ග්‍රැහම්චේම්බර්ස් විසින් ලියා 1867දී ප්‍රකාශයට පත් කරන ලදී.

© www.wsws.org